# චීනයෙහි බුදු දහම වර්ධනය වීම සඳහා බලපෑ හේතු සාධක පිළිබඳ අධ්‍යයනයක්

*දිල්ශාන් මනෝජ් රාජපක්ෂ* [1]

චීන බුදු දහමේ සංවර්ධනය සියවස් ගණනාවක් තිස්සේ විකාශනය වූවකි. චීනයේ බුදු දහම විවිධ අංශවලින් වර්ධනය වීමට අවම වශයෙන් සියවස් දෙකක් හෝ තුනක්වත් ගත වූ බව පෙනේ. එකී කාල පරාසය අවධීන් පහක් ඔස්සේ සංවර්ධනය වූ බව ඓතිහාසික සාධක අනුව හඳුනාගත හැකිය;

1. බුදු දහම හඳුන්වා දුන් ක්‍රි. ව. 67, හන් අධිරාජ්‍යයේ අවසානය ලෙස සැලකෙන ක්‍රි. ව. 220 දක්වා කාල පරිච්ඡේදය
2. දේශපාලන වියවුල් සමග දිවෙන ක්‍රි. ව. 221-581 දක්වා වූ කාල පරිච්ඡේදය
3. දේශපාලන ස්ථාවරත්වයක් ඇති වූ ස්වි අධිරාජ්‍ය සමයේ ක්‍රි. ව. 581 ටං අධිරාජ්‍යය දක්වා ක්‍රි. ව. 907 වූ කෙටි කාල පරිච්ඡේදය
4. බුදු දහමේ පරිහානිය සිදුවන ලියං අධිරාජ්‍යයේ සිට චිං අධිරාජ්‍යය දක්වා ක්‍රි. ව. 908.-1911 වූ කාල පරිච්ඡේදය
5. චීන බුදු දහමේ නූතන අවධිය

විවිධ ඇදහිලි හා විශ්වාස, ආගම් හා දර්ශන සමූහයක් සමග ගලා යන්නට වූ චීන ශිෂ්ටාචාරයෙහි ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවස ඉතා වැදගත් තැනක් උසුලයි. එයට හේතුව වන්නේ, විදේශීය රටකින් අභිනව ආගමක් වශයෙන් හඳුන්වා දුන් බුදු දහම චීන සංස්කෘතියේ නව සන්ධිස්ථානයක් සනිටුහන් කිරීමයි. චීනයේ බුදු දහම සංවර්ධනය වීම සඳහා බලපෑ හේතු සාධක සැකෙවින් සාකච්ඡා කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණයි. එලෙස බුදුසමය සංවර්ධනයට බලපෑ හේතු සාධක පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැකිය;

1. රාජ්‍ය අනුග්‍රහය
2. පොත-පත පරිවර්තනය
3. ජන ජීවිතය පෝෂණය කෙරෙහි එමගින් සැපයුණු පිටුබලය
4. ආරාමය කේන්ද්‍ර කොටගත් ජන ජීවිතය
5. භික්ෂු-භික්ෂුණී ශාසනයේ වර්ධනය
6. කලා ශිල්ප

බුදුන් වහන්සේ විසින් දේශිත ධර්මය නම්‍යශීලිත්වයකින් හා සහනශීලී ප්‍රතිපදාවකින් යුක්ත වීම සහ සංඝයා වහන්සේලාගේ අප්‍රතිහත කැපවීම ආදිය නිසා බුදු දහමේ පැවැත්ම චිරස්ථායී විය. මධ්‍ය ආසියාවෙන්ද භාරතයෙන්ද නිබඳව ලැබුණු පොත-.පත චීන ජනයාගේ ආධ්‍යාත්මය පෝෂණය කළ අතර රට පුරා බුදු දහම ව්‍යාප්ත කිරීමට බෞද්ධ නිකාය රැසක්ද චීනයේ නිර්මාණය වී තිබිණි.

**ප්‍රමුඛ පද:** චීනය, බුදුදහම, බුදුන් වහන්සේ, අධිරාජ්‍ය යුග

[1]*Ph. D. Candidate, Department of Pali and Buddhist Studies, University of Kelaniya, Sri Lanka.* *dilshanmanojrajapaksha@gmail.com*